# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්‍ෂණය - 2020
# Primary Piriven First Term Test - 2020

**(03) ත්‍රිපිටක ධර්මය *I***
**ශ්‍රේණිය 02**

කාලය ඃ පැය 01
Time

**සැලකිය යුතුයි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.**

## I කොටස

1) බෝසතාණන් වහන්සේගේ මහාභිනිෂ්ක්‍රමණය සිදුවූයේ,
(1) වෙසක් පොහෝ දින (2) ඇසළ පොහෝ දින (3) පොසොන් පොහෝ දින

2) බුදු සිරුරින් සවනක් ගණ බුදුරැස් විහිදෙන්න වූයේ සත්සතියේ,
(1) දෙවන සතියේදී (2) සිව්වන සතියේදී (3) හයවන සතියේදී ය.

3) බුදුරජාණන් වහන්සේ පළමුව ධර්මය දේශනා කිරීමට තීරණය කළේ,
(1) ආලාරකාලාමටය (2) උද්දකරාම පුත්තටය (3) පස්වග තවුසන්ටය

4) ''ඔබේ ඉඳුරන් ප්‍රසන්නය, ඔබේ ශරීර වර්ණය පැහැපත්ය, ඔබගේ ගුරුවරයා කවරෙක් ද? ඔබ අදහන්නේ කාගේ ධර්මයක් ද?'' මේ ප්‍රකාශය කලේ...
(1) ආලාරකාලාම (2) තපස්සු භල්ලුක (3) උපක ආජීවක

5) මහා ධර්මපාල ජාතකය දේශනා කළේ කා හට ද?
(1) යසෝධරා දේවියටය (2) ප්‍රජාපතී ගෝතමියට (3) සුද්දෝධන රජුටය

6) මහා ධර්මපාල ජාතකයට අනුව දීර්ඝායුෂ විඳීමට හේතු අතරින් එකක් වනුයේ,
(1) සතුන් මැරීමය (2) බොරු නොකීමය (3) අසත්පුරුෂ ඇසුරය

7) මහා මංගල සූත්‍රයේ මංගල කරුණු කීයක් ඇතුළත්වේ ද?
(1) 37 කි (2) 39 කි (3) 38 කි

8) ''අසේවනාච බාලානං'' යන්නෙහි අර්ථය වන්නේ,
(1) පණ්ඩිතයන් ඇසුරු කිරීමය (2) බාලයන් ඇසුරු නොකිරීමය
(3) වයසින් බාල අය ඇසුරු කිරීමය

9) නිග්‍රෝධ සාමණේරයන් වහන්සේට එම නම ලැබුණේ කෙසේ ද?
(1) මගධයේ උපන් නිසාය (2) නුග ගසක් යට උපන් නිසාය
(3) සල් ගසක් යට උපන් නිසාය

10) තණ්හා, රති, රගා යනු,
(1) දිව්‍යාංගනාවෝය (2) භික්ෂුණියන්ය (3) මාර දූවරුය

(2 × 10 = 20)

## II කොටස

**පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. ත්‍රිවිද්‍යාවෙන් දෙකක් නම් කරන්න.

ii. සත් සතියේ පස්වන සතියෙහි සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් නම් කරන්න.

iii. ''මහණෙනි, මා මීට පෙර කිසිදා ඔබට බුදු වූ බවක් කියා ඇත් ද? මේ ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද?

iv. චතුරංගසමන්නාගත වීර්යයෙන් දෙකක් ලියන්න.

v. නිග්‍රෝධ සාමනේරයන්ගේ දෙමාපියන් නම් කරන්න.

vi. ''පතිරූප දේස වාසොච'' යන මංගල සූත්‍ර ගාථාවේ එන මංගල කරුණු දෙකක් ලියන්න.

vii. කයෙන් සිදුවන වැරදි දෙකක් නම් කරන්න.

viii. දෙතිස් කුණපයන්ගේ හතරක් ලියන්න.

ix. ත්‍රි ශික්ෂාව නම් කරන්න.

x. ''පුබ්බේව දානා සුමනා භාවාම'' යන්නෙහි සරල අර්ථය ලියන්න.

(2 × 10 = 20)

## III කොටස

1) *i.* පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.
   1. අහං හි අරහා ලොකෙ.......
   2. යෙ ධම්මා හෙතු පපභවා
   3. මාතා පිතු උපට්ඨානං.....
   4. ආරති විරති පාපා.......

   *ii.* ඉන් ඔබ කැමති ගාථාවක සරල අර්ථය ලියන්න.

(5 + 10 = 15)

2) *i.* සත්සතිය වඳින ගාථාව ලියන්න.

   *ii.* ඉන් සිව්වන සතිය විස්තර කරන්න.

(5 + 10 = 15)

3) *i.* මහා ධර්මපාල ජාතකය දේශනා කිරීමට හේතු වූ වර්තමාන කතාව ලියා දක්වන්න.

   *ii.* එහි සඳහන් ධර්මපාල බමුණු ගමෙහි බාලයන් මිය නොයාමට හේතු වූ කරුණු අතරින් පහක් ලියන්න.

(5 + 10 = 15)

4) *i.* මාතික මාතා චරිතයෙන් ගත හැකි ආදර්ශ මොනවා ද?

   *ii.* සාමණේරයන් වන ඔබට දායිකා මව්වරුන්ගෙන් ලැබෙන මව් සෙනෙහස ගැන වැකි පහක් ලියන්න.

(5 + 10 = 15)

5) *i.* අශෝක රජතුමා පැහැදීමට තරම් නිග්‍රෝධ සාමණේරයන් තුල පැවති ගුණාංග මොනවා ද ලියන්න.

   *ii.* නිග්‍රෝධ සාමණේර හිමිගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ මොනවා ද? ලියන්න.

(5 + 10 = 15)

6) *i.* තච පංචකය නම් කරන්න.

   *ii.* ''කායගතා සතිය' භාවනාව වඩන්නේ කෙසේ ද? කෙටියෙන් විස්තර කරන්න.

(5 + 10 = 15)